INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

2020 මැයි 26

**මාධ්‍ය නිවේදනය: ශ්‍රී ලංකාවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ලෙස වධක චූදිතයෙක්**

***ජොහැන්නස්බර්ග්:*** වධකයකු ලෙස චෝදනා ලැබීමෙන් ප්‍රසිද්ධියට පත් අයකු ප්‍රධානියා ලෙස පත් කර ඇති ශ්‍රී ලංකාවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට (CID) දෙන ජාත්‍යන්තර සහයෝගය වහාම නැවත සලකා බැලීමට කාලය එළැඹ තිබේ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් අලුත් CID අධ්‍යක්ෂ ලෙස ඉකුත් සිකුරාදා පත් කර ඇත්තේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ආඩම්බරගේ රුවන් ප්‍රසන්න ජයක් ද අල්විස් ය[1].

වධබන්ධන හා සම්බන්ධ අධිකරණ ලේඛණ ගණනාවකම ප්‍රසන්න ද අල්විස් නම් කොට තිබේ. දෙමළ එකොලොස් දෙනකු විසින් විසින් ගෝඨාභය රාජපක්ෂට එරෙහිව 2019 කැලිෆෝනියාවේදී ගොනු කරන ලද නඩුව ඉන් එකකි. වෙනත් අය අතර අල්විස් ගැනද සඳහන් වන පිටු 13 ක ගොනුවක් එම නඩුවේ සාක්ෂි ලෙස ඉදිරිපත් කරන ලදී[2].

*" විශේෂයෙන්ම පාර්ලිමේන්තු මැතිවරණයට කලින් මේ ගෙන ඇත්තේ මහත්සේ පීඩාගෙනදෙන පියවරකි,"* යි සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. *"තමන්ට වධහිංසා කළ හෝ වධ දීමට සම්බන්ධ හෝ බවට රැඳවියන් කිහිපදෙනකුම 1998 තරම් ඈත කාලයක සිට ප්‍රසන්න ද අල්විස් නම් කොට තිබේ. යුද සමයේ පොලිස් ත්‍රස්ත විමර්ශන ඒකකයේ අල්විස් සිටි කාලයේ ඔහුට සෘජුවම නියෝග දුන් ගෝඨාභය රාජපක්ෂට, ප්‍රසන්න ද අල්විස් දිගටම ඉතාමත් පක්ෂපාතීව සිටි අයෙකි."*

ප්‍රසන්න ද අල්විස් ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාස මුලස්ථානයේ රාජකාරි කළ කාල වකවානුවේ TID විසින් ආයතනගතව කරන ලද වධහිංසා පිළිබඳව එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණ කිහිපයක් විසින්ම ලේඛනගත කොට තිබේ. වධහිංසාව පිළිබඳ විශේෂ නියෝජිතයන් ද, මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය (OHCHR) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනයේ වාර්තාව (OISL) ද මේ අතර වෙයි. මේ කාලය තුල TID විසින් යොදාගන්නා ලද කෲර වධහිංසා විධික්‍රම ගැන එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්ෂික මානව හිමිකම් වාර්තා සෑමෙකකම පාහේ සඳහන් වෙයි. වධබන්ධනයෙන් පසු දිවි ගලවා ගෙන රටවල් 5ක ජීවත්වන 73 දෙනකුගේ සාක්ෂි වාචක මත පදනම් වී 2019 දී ITJP විසින් පල කරන ලද සවිස්තර වාර්තාවකට විෂය වුනේ මේ කුප්‍රකට පොලිස් ඒකකයයි. විධාන වගකීම දරන පුද්ගලයන්ද ඇතුළු වධක චෝදනා ලබන ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ 58 දෙනකු ද එම වාර්තාවෙන්

[1] http://www.dailymirror.lk/breaking_news/CID-MSD-SIU-Directors-among-latest-police-transfers/108-188785
[2] https://itjpsl.com/assets/press/ECF-No.-0066-3-Exhibit-B-to-Sooka-Decl.pdf Page 43.

හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකාවේ නිල සංචාරයක යෙදුනු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිත මැන්ෆ්‍රඩ් නොවැක් 2007 තරම් ඈත කාලයකදී එම අපරාධ වූදිතයන් අතරින් කිහිප දෙනකුම නම් කර තිබුණි. ඒ කිසිවකුත් විමර්ශනයට හෝ දඬුවමට හෝ ලක් කර නැත. ඒ වෙනුවට කර ඇත්තේ ඉන් බොහොමයකට උසස්වීම් ලබා දීමයි.

*“මේ මිනිසා ශ්‍රී ලංකාවේ දණ්ඩ මුක්තිය සංකේතවත් කරන්නෙකි,”* යි යැස්මින් සූකා පැවසුවාය. *“වධබන්ධන සම්බන්ධයෙන් වගකිව යුත්තන් වගඋත්තරකාරිත්වයෙන් බැඳ තබන බවට සහතික කිරීමට ජාත්‍යන්තර ප්‍රජාව බැඳී සිටී. වධකයන් පූර්ව සෝදිසියට ලක් කර මහජන රාජකාරියෙන් ඉවත් කිරීමට ශ්‍රී ලංකාව ස්වකීය ජාත්‍යන්තර පොරොන්දු ප්‍රකාර බැඳී සිටී.”*

ගෝඨාබය රාජපක්ෂට විරුද්ධව 2019 දී කැලිෆෝනියාවේ නඩු පැවරූ කැනඩා පුරවැසි රෝයි සමාදානම් අධිකරණයට ඉදිරිපත් කළ ප්‍රකාශයෙන් කියා සිටියේ 2007 දෙසැම්බරයේ TID අත්අඩංගුවේ සිටියදී ප්‍රසන්න ද අල්විස් සහ ගෝඨාභය රාජපක්ෂ තමන් සම්බන්ධ සිද්ධිය ගැන දුරකතනයෙන් කතාකරනු ඇසුණු බවයි. එදින රාත්‍රියේ TID නිලධාරීන් විසින් දෙනලද මහත් වධබන්ධන කෙලවර වී ඇත්තේ ඔහුගේ වම් මැණික් කටුව ඉදිමී, දණහිස් තුවාලවී බඩ සහ යටිබඩ කැක්කුම් දෙමිනි. පසුදා උදේ ප්‍රසන්න ද අල්විස් රෝයිගෙන් අසා ඇත්තේ කලින්දා රෑ සිදුවූයේ කුමක්ද කියාය. පහර දීම ගැන රතු කුරුස සංවිධානයට නොකියන ලෙස අනතුරු ඇඟවූ ඔහු රෝයි පාපෝච්චාරණයකට අත්සන් තබන්නේ නම් තව දුරටත් ගුටි කන්නට සිදු නොවන බවත්, නිදහස් කර යවන බවත් පවසා තිබේ. නීතිඥවරයකු මුණගැසීමට අවශ්‍ය බව රෝයි කීවිට පොලිස් නිලධාරියා පිළිතුරු දී ඇත්තේ “ඔහෙට නීතිඥයෙක් ගන්න බෑ. මෙහෙ කාටවත් ඔහෙට උදව් කරන්න පුළුවන් කමක් නෑ,” යි පවසමිනි. TID අත්අඩංගුවේ විඳි වධහිංසා සම්බන්ධයෙන් රෝයි සමාදානම්ට වන්දි ගෙවන ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය 2016 දී ශ්‍රී ලංකාවේ රජයට දුන් නියෝගය තවමත් පිලිපැද නැත[3].

යුද සමයේ අත් අඩංගුවේ දී වධබන්ධනයට ගොදුරුවූ මාධ්‍යවේදීන් කිහිපදෙනකු ගොනුකළ මූලික මානව හිමිකම් පෙත්සමක ද ප්‍රසන්න ද අල්විස් නම් කර තිබේ. ඒ මාධ්‍යවේදීන් අතර වෙට්ටිවේල් ජසිකරන් හා ඔහුගේ සහකාරිය වලර්මතී වඩිවේලුද, අයුතු ලෙස දණ්ඩනයට ලක්වීම පිළිබඳ සංකේතයක්[4] ලෙස ජනාධිපති ඔබාමා විසින් හඳුන්වනු ලැබූ ජයප්‍රකාශ් සිත්තම්පලම් තිස්සනායගම් ද වෙයි.

මීට අමතරව, සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග 2009 ඝාතනය කිරීම සම්බන්ධ විමර්ශනයේ ඔහුගේ භූමිකාවට අදාලව අල්විස්ගෙන් ප්‍රශ්න කර තිබේ. ලසන්තගේ ඝාතනය සම්බන්ධයෙන් හිටපු හමුදාපති සරත් ෆොන්සේකා ගාවා දෙමින් සාක්ෂි දුන්නොත්, රජයේ සාක්කි කරුවකු කොට විදේශීය රැකියාවක් ලබා දෙන බවට අල්විස් බලපෑම් කළ බව 2010 දී TID විසින් අත් අඩංගුවට ගන්නා ලද හිටපු හමුදා  බුද්ධි අංශ නිලධාරී කන්දේගෙදර පියවංශ 2016 දී විවෘත අධිකරණය හමුවේ කියා සිටියේය[5].

2017 පෙබරවාරියේදී එවක TID අධ්‍යක්ෂ, නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා විසින් ප්‍රසන්න ද සිල්වාට විරුද්ධව පොලිස්පතිට පැමිණිල්ලක් කරන ලද බව වාර්තාවල දැක්වේ.  එම පැමිණිල්ලේ මූල්‍ය වංචා සම්බන්ධයෙන් මෙන්ම ලසන්ත වික්‍රමතුංග ඝාතනයට සරත් ෆොන්සේකා ගාවන්නට අල්විස් උත්සාහ කළ බවටත් චෝදනා නැගී ඇත. ගෝඨාභය රාජපක්ෂ, එවක ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ ප්‍රසන්න ද අල්විස් ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයක් කිරීමේ චෝදනා වලට අදාලව නාලක ද සිල්වා පසු කලෙක අත් අඩංගුවට ගන්නා ලදී[6].  ප්‍රසන්න ද සිල්වා ට එරෙහි පොලිස් පැමිණිල්ල විමර්ශනය කොට ඔහුගේ ඉහල නිලධාරියා විසින් කරන ලද චෝදනා සම්බන්ධයෙන් ඔහු නිර්දෝෂී කරන ලද්දේ දැයි පැහැදිලි නැත.

මීට අමතරව ITJP විසින් සම්මුඛ පරීක්ෂිත තවත් සාක්ෂිකරුවන් එකොළොස් දෙනෙක්[7] තම සාක්ෂි වාචකයේ ප්‍රසන්න ද අල්විස් නමින් සඳහන් කර තිබේ. TID කොළඹ මූලස්ථානයේත්, බූස්ස රැඳවුම් කඳවුරේත් ආයතනගත ලෙසින් වධහිංසා පැමිණවීම පිළිබඳව ඔහු දැන සිටි බවට චෝදනා කරන ඔවුහු, වධහිංසාවට ගොදුරු වන රැඳවියන් ගේ කෑමොර දීම් අල්විස් රාත්‍රී යාමයේ ඔහුගේ කාර්යාලයේ වැඩ කරමින් සිටින විට නොතකා හැරෙන්නට කිසිදු ඉඩක් නැති බව පවසති. එක් රැඳවියකු චෝදනා කළ පරිදි බොරු

---

3 http://docstore.ohchr.org/SelfServices/FilesHandler.ashx?enc=6QkG1d%2FPPRiCAqhKb7yhsukPtYsnxNH1DBeueuCbK4hkTaGALQTpP6XpwSalkyo%2FLgQxV9qfCNKUejQM1toFhnFL9Pb1%2FLHlv%2BzEoA3ETh7F6N70gpwuCEmo2ItyaC7I0Ow9wfXUd%2FDfXG%2F8ml4sJQ%3D%3D

4 https://www.thetimes.co.uk/article/js-tissainayagam-journalist-lauded-by-obama-is-jailed-in-sri-lanka-5xrbl5z2dg2

5 https://www.vikalpa.org/?p=19250

6 https://economynext.com/sri-lanka-police-officer-arrested-over-plot-to-kill-deputy-11952/

7 අධිකරණ ලියවිලි වල දහයකි; W315 ඉන් පසු සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලදී.

සාක්ෂියක් දීමට පොලඹවා ගැනීම සඳහා අල්විස් උත්සාහ දරා තිබේ. තවත් අයකු කී පරිදි අල්විස්ගේ කාමරයට ගෙන යනු ලැබූ සෑම අවස්ථාවකම ඔහුට බලකොට ඇත්තේ දණගසාගෙන ඉඳීමටය. තම කාර්යාලයට ගෙන එන රැඳවියන්ට කම්මුල් පහර දී තර්ජන කළ බවට ඔහුට විරුද්ධව චෝදනා තිබේ. තවත් අයකු කී පරිදි, බොරු නොකියන ලෙස අල්විස් අණ කොට කාමරයෙන් පිටවී ගිය පසු ඔහුගේ පහල නිලධාරීන් හතර දෙනෙක් ශබ්දය යටපත් වන සේ රේඩියෝවේ හඬ නංවා ඔහුට දරුණු ලෙස ගුටි බැට දී තිබේ. ආපසු ආ අල්විස් පීඩාකාරී ඉරියව්වක සිටීමට තමන්ට බල කළ පහල නිලධාරියකු වලකා ලන්නට පියවර නොගත් බව සාක්ෂිකරුවා පවසයි.

සිරකරුවන් එල්ලීම සඳහා සීලිමේ යකඩ බාල්කයක ලනු දමා වද දීමට කොළඹ සකස් කර තිබූ ප්‍රශ්න කරන කාමරයක් ගැන TID රැඳවියන් විස්තර කර තිබේ. දෑස් බඳින ලද නිරුවත් සිරකරුවන් එම කාමරයට ගෙනයනු දැක ඇති ඔහු  පවසන පරිදි සමහර අවස්ථා වල ඇතුලට යන ඔහු, රැඳවියන්ගෙන් වැඩිපුර තොරතුරු ලබා නොගැනීම ගැන පහල නිලධාරීන්ට දොස් පවරා තිබේ. රැඳවියන් පවසන පරිදි ''ගෝටාගේ මිනිහා'' ලෙස හැමදෙනාම හැඳින්වූ අල්විස්ට වඩා ජොෂ්ඨයන් පවා තීන්දු ගැනීම භාර දී ඇත්තේ ඔහුටය.

*''ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම් සමයේ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය පැවතුනේ ඔහු යටතේය; දැන් එම පාත්‍ර වර්ගයාටම පත්වීම් දී තිබීම ශ්‍රී ලංකාව සමග ගනුදෙනු කරන කාට වුනත් අනතුරු ඇඟවීමේ සීනු නාදයක් විය යුතුය,''යි යැස්මින් සූකා පැවසුවාය. ''කිසිදු එක්සත් ජනපද ආධාරයක් නොලැබිය යුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ලේහි නීතිය ක්‍රියාවේ යොදවනු ඇතැයි යන්න අපේ අපේක්ෂාවයි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ පොලිසිය පුහුණු කිරීමේ නිරතව සිටින බ්‍රිතාන්‍ය රජය CIDය සමග ඇති කිසියම් වැඩසටහනක් වේ නම්, එය අත් හිටුවනු ඇතැයි යන්නද අපේ බලාපොරොත්තුවකි. මීට අමතරව, මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය සහ එක්සත් ජාතීන්ගේ සාමසාධනයද CID සම්බන්ධයෙන් ඒ හා සමාන සෝදිසි කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය.''*

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT